05/05/2011 - ලංකාදීප

**මිලින්ද මොරගොඩ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ධුරයකට**

හිටපු අමාත්‍යවරයකු සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ප්‍රවීණයකු වන මිලින්ද මොරගොඩ මහතා ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයකු වශයෙන් පත්කර ලැබ සිටී. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් මෙම පත්වීම සිදුකර ඇත.

2000 සිට 2010 දක්වා කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ මොරගොඩ මහතා අධිකරණ සහ සංචාරක කටයුතු පදවි ද හොබවා ඇත.

ජාත්‍යන්තර කොමිෂන් සභා ගණනාවකද සාමාජිකත්වය දැරූ මොරගොඩ මහතා ඉදිරි දිනවලදී නව තනතුරේ රාජකාරී බාරගැනීමට නියමිතය.